සත්යය දුටු විටෙක හෝ එය දැනගත් විටෙක ඔබ අතරින් කිසිදු පුද්ගලයකු හෝ මිනිසුනට බියෙන් ඒ ගැන කතා කිරීමෙන් වැළකී නොසිටිය යුතුය

නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණන් ප්රකාශ කළ බව අබූ සඊද් අල් කුඃද්රී (රළියල්ලාහු අන්හු) තුමා විසින් මෙසේ වාර්තා කරන ලදී: "සත්යය දුටු විටෙක හෝ එය දැනගත් විටෙක ඔබ අතරින් කිසිදු පුද්ගලයකු හෝ මිනිසුනට බියෙන් ඒ ගැන කතා කිරීමෙන් වැළකී නොසිටිය යුතුය."
[صحيح] [رواه الترمذي وابن ماجه وأحمد]

නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණෝ තම සහගාමීන් අතර දේශනා කර ඇත්තාහ. එසේ එතුමාණන් කළ දේශනා අතරින් එකක් නම්, 'මුස්ලිම්වරයකු සත්යය දුටු විටෙක හෝ එය දැනගත් විටෙක මිනිසුනට බියෙන් හෝ ඔවුන්ගේ මැසිවලට බියෙන් සත්යය ප්රකාශ කිරීමෙන් වැළකී නො සිටිය යුතු බවයි'.

http://www.sunnah.global/hadeeth/si/show/66273